# A BIBLIOGRAPHICAL COMMENTARY ON THE LITERATURE BASED ON KATARAGAMA, THE SACRED PLACE OF SRI LANKN DOVOTEES

R.A.P.S. Senevirathna[1]

**Abstract**

Kataragama shrine can be considered a prominent religious place located in the southern part of Sri Lanka. Researchers, scholars, and writers who are exploring the knowledge of subjects such as this shrine and its related rituals, customs, faiths, and beliefs can be seen focusing on it. The main objective of this study is to identify the literature written in this area. Also, to classify the literature written about the Kataragama sacred site and to create a bibliography containing bibliographic information about it. Other purposes of this commentary are to inform the reader of the quality, relevance, and accuracy of the sources cited. Mainly this research is based on secondary data. Libraries, printed books, websites, and catalogs were the sources of information gathering. Through data analysis, 59 books written in this regard were selected. Among the works that have been written about Kataragama, most of the books have been written about Kataragama shrine, Kataragama God, rituals, customs, and beliefs. Works published in Sri Lanka on Kataragama as well as works published in other countries are included. Among the authors who have written books about Kataragama, there are not only Sri Lankan authors living in foreign countries but also foreign authors. A large number of works written in Sinhala and English can be seen and not only in the libraries of this country, but also in the libraries of foreign countries, the works written about Kataragama can be seen. Since these contain information including Indigenous knowledge such as sacrificial methods, rituals, beliefs, and beliefs, it can be suggested that they should be preserved for their conservation and future generations.

**Keywords:** Kataragama, God Kataragama, Bibliography, Indigenous Knowledge, Cultural Heritage

---

[1] Senior Assistant Librarian, University of Ruhuna, Sri Lanka.

Email: saku@lib.ruh.ac.lk https://orcid.org/0000-0002-3008-6189

Accepted the revised version: 01 December 2023. This work is licensed under C BY-SA 4.0. To view a copy of this license, visit http://creativecommons.org/licenses/by-sa/4.0/

# ශ්‍රී ලාංකීය බැතිමතුන්ගේ දකුණුලක පුදබිම හෙවත් කතරගම පාදක සාහිත්‍ය පිළිබඳ ග්‍රන්ථ නාමාවලියක්

**සාරසංක්ෂේපය**

වර්තමාන කතරගම පුදබිම දකුණු ප්‍රදේශයේ පිහිටි ප්‍රධාන පූජනීය ස්ථානයක් ලෙස හැඳින්විය හැක. මෙම සිද්ධස්ථානය හා ඒ ආශ්‍රිත විවිධ චාරිත්‍ර, පුද සිරිත්, ඇදහිලි හා විශ්වාස වැනි විෂය ක්ෂේත්‍රයන් පිළිබඳ දැනුම ගවේෂණය කරන පර්යේෂකයන්, විද්‍යාර්ථීන්, ග්‍රන්ථ රචකයන් ඒ සම්බන්ධව අවධානය යොමු කරනු දැකිය හැක. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ මෙම ප්‍රදේශය සම්බන්ධව ලියවී ඇති සාහිත්‍යයන් හඳුනා ගැනීමයි. එමෙන්ම කතරගම පුදබිම පිළිබඳ රචනා වී ඇති සාහිත්‍ය වර්ගීකරණය කිරීම හා ඒ පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඇතුලත් ග්‍රන්ථ නාමාවලිය නිර්මාණය කිරීමයි. මෙම විවරණයේ සෙසු පරමාර්ථයන් වන්නේ උපුටා දක්වන ලද මූලාශ්‍රවල ගුණාත්මක බව, අදාළත්වය සහ නිරවද්‍යතාවය පාඨකයාට දැනුම්දීමයි. ප්‍රධාන වශයෙන් මෙම පර්යේෂණය පදනම් වී ඇත්තේ ද්විතීක දත්ත මතය. පුස්තකාල, මුද්‍රිත ග්‍රන්ථ, වෙබ් අඩවි හා සුචි ආදිය තොරතුරු එක් රැස් කිරීමේ මූලාශ්‍ර විය. දත්ත විශ්ලේෂණය තුලින් මේ සම්බන්ධයෙන් ලියවී ඇති ග්‍රන්ථ 59 ක් තෝරා ගන්නා ලදී. කතරගම පිළිබඳ රචනා වී ඇති කෘති අතර වැඩි ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා වී ඇත්තේ කතරගම පුදබිම, කතරගම දෙවියන්, චාරිත්‍ර සිරිත් ඇදහිලි විශ්වාස සම්බන්ධයෙනි. කතරගම පිළිබඳ ශ්‍රී ලංකාව තුලදී ප්‍රකාශයට පත් වූ කෘති මෙන්ම, වෙනත් රටවලදී ප්‍රකාශයට පත් වූ කෘති ද අන්තර්ගත වී ඇත. කතරගම පිළිබඳ ග්‍රන්ථ රචනා කරන ලද කතුවරුන් අතර ශ්‍රී ලංකාවේ කතුවරුන් මෙන්ම විදේශීය රටවල ජීවත්වන ශ්‍රී ලාංකික කතුවරුන් පමණක් නොව විදේශීය කතුවරුන් ද වීම විශේෂත්වයකි. සිංහල හා ඉංග්‍රීසි භාෂාවෙන් රචිත කෘති වැඩි ප්‍රමාණයක් දැකිය හැකි අතර මෙරට පුස්තකාලවල පමණක් නොව විදෙස් රටවල පුස්තකාලවලද කතරගම පිලිබඳ රචනා වූ කෘති දැක ගත හැකිවිය. ඒ ඒ ප්‍රදේශයන්ට ආවේණික පූජා විධි, චාරිත්‍ර වාරිත්‍ර, ඇදහිලි හා විශ්වාස වැනි දේශීය දැනුම ඇතුලත් තොරතුරු මේවායෙහි අන්තර්ගතව ඇති බැවින් ඒවායෙහි ආරක්ෂාව පිළිබඳ සහ මතු පරපුර සඳහා ඒවා සංරක්ෂණය කර තැබීම සුදුසු බව යෝජනා කල හැකිය.

**ප්‍රමුඛ පද:** කතරගම, කතරගම දෙවියන්, ග්‍රන්ථ නාමාවලී, දේශීය දැනුම, අස්පර්ෂණීය සංස්කෘතික උරුමය

## හැඳින්වීම

### කතරගම පිළිබඳ හැඳින්වීම

අතීතයේ කාචරගම නමින් හැඳින්වූ වර්තමාන කතරගම පුදබිම දකුණු ප්‍රදේශයේ පිහිටි ප්‍රධාන පූජනීය ස්ථානයක් ලෙස හැඳින්විය හැක. රුහුණේ මාගම රාජධානියට සමීපව පිහිටි කතරගම පිළිබඳ කරුණු සඳහන් වන පැරණිතම ලේඛනය මහාදාඨික මහානාග රජතුමාගේ කතරගම අභිලේඛනයයි (ශිලා ලේඛන සංග්‍රහය, 1954). මහාවංශය කතරගම හඳුන්වා ඇත්තේ කාජරගාම නමිනි (මහාවංශය, 1956). ධාතුවංසයේ කදරගම (ධාතුවංශය, 1941) යන නමිනුත්, පූජාවලියෙහි කාචරගම (පූජාවලිය, 1953) ලෙසත්, ථූපවංශය හා රසවාහිනියෙහි කජ්ප කන්දර ගාම (ථූපවංශය, 1956 සහ රසවාහිනිය, 1961) ලෙසත් දක්වා ඇත්තේ වර්තමාන කතරගමය. බෞද්ධ හා හින්දු සිද්ධස්ථාන සංකීර්ණයක් වන කතරගම ශ්‍රී ලාංකීය බෞද්ධ ජනතාව, දෙමළ හින්දු හා මුස්ලිම් ජනතාව පමණක් නොව ස්වදේශීය වැදි ජනතාව ද පුද පූජා පවත්වනු ලබයි. මෙලෙස ශ්‍රී ලාංකීය සියලු ජන කොටස් අතර මෙම සිද්ධස්ථානය ප්‍රචලිත වීමට විවිධ හේතු බලපා ඇත. කිරිවෙහෙර, කතරගම දේවාලය, කතරගම පෙරහර මංගල්‍ය, මුරුගන් හා කතරගම දෙවියන් ඒ අතර ප්‍රබල සාධක වේ. පුරාවිද්‍යාත්මක හා සාහිත්‍යමය සාධක අතින් බැලුව ද බෞද්ධ, හින්දු, මුස්ලිම්, වැදි ආදී විවිධ පුරාවෘත්ත පිළිබඳ අධ්‍යයනයේදී පැහැදිලි වන්නේ ලංකාවේ අනෙකුත් සිද්ධස්ථාන හා සසඳන විට ශ්‍රී ලාංකිකයන් ලෙස සෑම ජන කණ්ඩායමක්

අතරම කතරගම සුවිශේෂී පූජනීය ස්ථානයක් බවයි. අද කතරගම වූ කලී සර්වාගමික පූජා භූමියකි (සෝරත හිමි, 2000). එපමණක් නොව විවිධ ඇදහිලි, විශ්වාස, ශාන්තිකර්ම, පූජාවිධි, චාරිත්‍ර හා පිලිවෙත් වැනි පැතිකඩයන් අතරද කතරගම සුවිශේෂී වේ. කතරගම පූජනීය ස්ථානය පිළිබඳ ශ්‍රී ලාංකිකයන් පමණක් නොව විදේශීය රටවල වෙසෙන හින්දු භක්තිකයන්ගේ පවා අවධානයට ලක් වී ඇත.

එසේම මෙම සිද්ධස්ථානය හා ඒ ආශ්‍රිත විවිධ චාරිත්‍ර, පුද සිරිත්, ඇදහිලි හා විශ්වාස වැනි විෂය ක්ෂේත්‍රයන් පිළිබඳ දැනුම ගවේෂණය කරන පර්යේෂකයන්, විද්‍යාර්ථීන්, ග්‍රන්ථ රචකයන් ඒ සම්බන්ධව අවධානය යොමු කරනු දැකිය හැක. එපමණක් නොව ඒ පිළිබඳ විවිධ තොරතුරු මූලාශ්‍රයන්ද රචනා වී ඇති අතර ඒවා පරිශීලනය සඳහා පාඨකයන් ද උනන්දුවක් දක්වනු දැකිය හැකිය.

**තොරතුරු මූලාශ්‍රවල වැදගත්කම**

කිසියම් තොරතුරක් ලබා ගැනීම සඳහා යොදා ගනු ලබන ඕනෑම මූලාශ්‍රයක් තොරතුරු මූලාශ්‍ර ලෙස හඳුන්වයි. එය මුද්‍රිත මූලාශ්‍රයක්, ශ්‍රව්‍ය දෘශ්‍ය මූලාශ්‍රයක්, විද්‍යුත් මූලාශ්‍රයක් පමණක් නොව යම් ද්‍රව්‍යයක්, පුද්ගලයෙක් හෝ ආයතනයක් ද විය හැක. ඒ ඒ තොරතුරු මූලාශ්‍රයන්හි ස්වරූපය, අන්තර්ගත තොරතුරුවල ස්වභාවය, ඒවා පෙළගස්වා ඇති ආකාරය යනාදි ලක්ෂණ අනුව විවිධ වර්ගයේ තොරතුරු මූලාශ්‍ර භාවිතයට හැකියාව ඇත. තොරතුරු සොයන්නා විසින් ඒ ඒ තොරතුරුවල අවශ්‍යතාවය මත විවිධ වර්ගයේ තොරතුරු මූලාශ්‍ර භාවිතයට ගනී.

මෙම පර්යේෂණය සඳහා පාදක කරගත් විෂය පථය වන ආගමික සිද්ධස්ථානයක් වශයෙන් කතරගම පිළිබඳ ලියවුණු විවිධ මූලාශ්‍ර දැකිය හැකිය. පූජනීය ස්ථානයක් වශයෙන් එහි වැදගත්කම පිළිබඳ ලියවුණු මූලාශ්‍ර මෙන්ම කතරගම දෙවියන් හා බැඳී ඇති ඇදහිලි හා විශ්වාස, කතරගම දේවාලය හා ආශ්‍රිත චාරිත්‍ර, පුද සිරිත්, කතරගම පෙරහැර හා බැඳී ඇති සිරිත් විරිත් යනාදී ලෙස ඒ ආශ්‍රිතව ලියවුණු විවිධ මූලාශ්‍ර නිර්මාණය වී ඇත.
ඒ අතර මුද්‍රිත ග්‍රන්ථ, ශාස්ත්‍රීය ලිපි, පුවත්පත් ලිපි, පර්යේෂණ පත්‍රිකා, පුස්ථිකා, උපාධි නිබන්ධන, අත්ලිපි, වාර්තා යනාදිය පමණක් නොව චිත්‍ර, වීඩියෝ පට, සීඩී හා ඩීවීඩී තැටි, ගීත, චිත්‍රපට යනාදිය පවා නිර්මාණය වී ඇත. විවිධ පුස්තකාල ආශ්‍රිතව මෙම මූලාශ්‍ර එකතුන් දැකිය හැකි වුවද ඒවා වෙන් වෙන් වශයෙන් ක්‍රමවත් හා සංවිධානාත්මකව පෙළ ගස්වන ලද ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු සහිතව දක්වා තිබීම පර්යේෂකයාට, පාඨකයාට තොරතුරු ලබා ගැනීම පහසුවක් වනු ඇත.

**සාහිත්‍ය විමර්ශනය**

යම්කිසි මාතෘකාවක් හෝ විෂය පථයක් සම්බන්ධව ලියවී ඇති සියලු තොරතුරු ඇතුලත් ග්‍රන්ථ විද්‍යාත්මක විස්තර සහිත මූලාශ්‍රයන් තිබීම යම්කිසි පර්යේෂකයකුට හෝ පාඨකයකුට නිසි මඟපෙන්වීමක් කරයි. එය පරිශීලකයාට කිසියම් පහසුවක් සපයන අතර කාලය අනවශ්‍ය ලෙස අපතේ යාමද අවම කර ගත හැකිය. ග්‍රන්ථ නාමාවලී හෝ විස්තරාත්මක ග්‍රන්ථ නාමාවලී මඟින් කරනුයේද මෙම කාර්යමය. සාහිත්‍ය විමර්ශනය තුලදී මේ සම්බන්ධව සිදු කරන ලද පර්යේෂණ පත්‍රිකා හෝ වෙනත් මූලාශ්‍ර සිදු කර ඇත්තේ ඉතා මන්දගාමී අයුරිනි.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය (1994) විසින් Selected bibliography on Kataragama නමින් ග්‍රන්ථ නාමාවලී මූලාශ්‍රයක් සම්පාදනය කර ඇත. මෙහි කතරගම පිළිබඳ ලියන ලද ලිපි ඇතුලත් කර ඇත. මෙහි අන්තර්ගත වන්නේ වාරසඟරා හා පුවත්පත්වල පල කරන ලද ලිපි පමණකි. ඒවායෙහි ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඇතුලත් කොට ඇති අතර 1993 දක්වා ලියවුණු මූලාශ්‍ර පාදක කොට ගෙන ඇත. සිංහල හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය දෙකෙන්ම ලියන ලද ලිපි වල ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු සපයා ඇත.

ආනන්ද තිස්ස (2019) විසින් ශ්‍රී ලංකා පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යාපනයෙහි ලා පාදක සාහිත්‍ය පිළිබඳ විචාරාත්මක විවරණයක් යන මෙයින් ලිපියක් ආනන්ද කරුණාරත්න උපහාර ලිපි සංග්‍රහයට සම්පාදනය කර ඇත. මෙම ලිපිය තුළින් ඔහු පෙන්වා දී ඇත්තේ ලංකාව තුළ පුස්තකාල විද්‍යා විෂය සම්බන්ධව ප්‍රකාශයට පත් කර ඇති සියලුම මූලාශ්‍ර පිළිබඳ තොරතුරුය. පුස්තකාල විද්‍යාවෙහිම උප විෂයයන් බෙදා දක්වමින් ඊට අදාළව ලියවී ඇති මූලාශ්‍ර දක්වා ඇත. පුස්තකාල විද්‍යාව සම්බන්ධව ලියවී ඇති තොරතුරු මූලාශ්‍ර පිළිබඳ ගවේෂණය කරන්නෙකුට මෙම ලිපිය තුලින් ඒකී විෂය පථය පිළිබඳ රචනා වී ඇති කෘති සියල්ලම සොයා ගැනීමට මඟපෙන්වීමක් කරනු ඇත.

De Silva (2016) විසින් Asian Elephants in Sri Lanka( A Selective Annotated Bibliography නමින් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. ආසියානු අලියා පිළිබඳ තොරතුරු ඇතුලත් වී ඇති පොත් හා වෙබ් අඩවි සම්බන්ධව ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඇතුලත් කරමින් විස්තරාත්මක ග්‍රන්ථ නාමාවලියක් ඉදිරිපත් කර ඇත. ආසියානු අලි පිලිබඳ තොරතුරු විමර්ශනයක යෙදෙන පර්යේෂකයන්ට බොහෝ තොරතුරු ප්‍රමාණයකට එම මූලාශ්‍රය මඟ පෙන්වයි.

Al-Ansari (2008) විසින් Library and Information Science Literature on the Gulf Cooperation Council (GCC) & Countries ( A Bibliographic Analysis )නමින් පර්යේෂණයක් සිදු කරමින් මෙම ලිපිය ගල්ෆ් සහයෝගිතා කවුන්සිලයේ (GCC) රටවල පුස්තකාල හා විඥාපන විද්‍යා සාහිත්‍යය පිළිබඳ ප්‍රකාශන 282 ක ග්‍රන්ථවිද්‍යාත්මක විශ්ලේෂණයක් ඉදිරිපත් කර ඇත. කර්තෘ රටා සහ මූලාශ්‍ර සඟරා සහ ඒවායේ මූලාරම්භය අධ්‍යයනය කිරීම අරමුණ විය. විස්තරාත්මක සාහිත්‍ය පදනම් කොට ගනිමින් සිදු කර ඇති මෙම පර්යේෂණය පුස්තකාල විද්‍යා සාහිත්‍යයේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම සඳහා නිර්දේශ කිහිපයක් ඉදිරිපත් කර ඇත.

The Netherlands Institute of International Relations (2004) ආයතනය විසින් ප්‍රකාශයට පත් කර ඇති Dealing with Diversity (Annotated Bibliography) නම් ග්‍රන්ථය මගින් සාමය හා ගැටුම් පිළිබඳ අන්තර්ගතව ලියවී ඇති පොත්පත් පිළිබඳ විස්තරාත්මක ග්‍රන්ථනාමාවලියකි. මෙම මාතෘකාව පිළිබඳ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවෙන් ලියවී ඇති පොත්පත් පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරුද සහිතව සවිස්තරාත්මක අන්තර්ගතයක් දක්වා ඇත. මෙම කෘතිය තුළින් සාමය හා ගැටුම් පිළිබඳ ලියවී ඇති සාහිත්‍ය පිළිබඳ විමර්ශනයක නියැලෙන පර්යේෂකයන්ට හා පාඨකයන්ට ඒ පිළිබඳ පුළුල් පරාසයක තොරතුරු සොයා ගත හැකිය.

Jayawardena and Senevirathna (2023) විසින් Bolgoda Ecosystem : A selected bibliography නමින් ග්‍රන්ථ නාමාවලියක් ප්‍රකාශයට පත් කර ඇත. බොල්ගොඩ ගඟ ජල විද්‍යාත්මක , පරිසර විද්‍යාත්මක හා ආර්ථික වශයෙන් වැදගත් කාර්‍යභාරයක් උසුලයි. පරිසර කලමනාකරණය හා සංරක්ෂණය පිළිබඳ උනන්දුවක් ඇති පර්යේෂකයන්, විද්‍යාර්ථීන් සහ පරිසරය හිතකාමීන් ඔවුන්ගේ තොරතුරු අවශ්‍යතාවයන් සඳහා බොල්ගොඩ පරිසර පද්ධතිය පිළිබඳ වැඩි අවධානය යොමු කරයි. මෙම ග්‍රන්ථ නාමාවලිය තුළ මේ සම්බන්ධයෙන් රචනා වී ඇති මුද්‍රිත ග්‍රන්ථ, පර්යේෂණ පත්‍රිකා, වාරසඟරා ලිපි, උපාධි නිබන්ධන, සම්මන්ත්‍රණ වාර්තා, වෙබ් අඩවි යනාදියෙහි තොරතුරු පාඨකයාට පහසුවෙන් ලබා ගැනීමට හැකි වන ලෙස තොරතුරු මූලාශ්‍රයේ නම, කර්තෘ, ප්‍රකාශන විස්තර යනාදී ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඇතුලත් කොට ග්‍රන්ථ නාමාවලියක් ඉදිරිපත් කොට ඇත.

Issak (2000) විසින් Public libraries in Africa : a report and annotated bibliography නමින් කෘතියක් සම්පාදනය කරමින් අප්‍රිකානු කලාපීය රටවල මහජන පුස්තකාල පිළිබඳ තොරතුරු දක්වා ඇත. විශේෂයෙන්ම අප්‍රිකානු රටවල් වන South Africa, Nigeria, Kenya, Zimbabwe, Tanzania, Uganda, Ghana, Botswana, Zambia වැනි රටවල මහජන පුස්තකාල සම්බන්ධයෙන් කරන ලද පර්යේෂණ ඇතුලත් ප්‍රකාශයට පත් වී ඇති වාර සඟරා ලිපි මෙම විස්තරාත්මක ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය සඳහා පාදක කොට ගෙන ඇත. ඒ අනුව ඒ ඒ රටවල මහජන පුසතකාලයන්හි තොරතුරු සේවා, දියුණුවෙමින් පවතින රටවල් ලෙස අප්‍රිකානු කලාපීය රටවල මහජන පුස්තකාල පිළිබඳ තත්ත්වයන්, ළමයින් සඳහා පුස්තකාල සේවා, මහජන පුස්තකාලවල තාක්ෂණය භාවිතය, මහජන පුස්තකාලවල භූමිකාව, සමාජීය සංවර්ධනය සඳහා මහජන පුස්තකාලවල දායකත්වය, මහජන පුස්තකාලවල තොරතුරු භුවමාරුව හා ප්‍රවර්ධනය යනාදී මහජන පුස්තකාල පාදක කොටගත් විවිධ මාතෘකා ඔස්සේ දකුණු කලාපීය රටවල මහජන පුස්තකාල පිළීබඳ තත්ත්වයන් ඇතුලත් තොරතුරු දක්වා ඇත. ඒ පිළිබඳ ලියවුණු සඟරා ලිපි පමණක් නොව පර්යේෂණ වාර්තා, පුවත්පත්වල පළවූ ලිපි ද මෙම විස්තරාත්මක ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය සඳහා යොදා ගෙන ඇත.

Hector-Mason and Bardack (2010) විසින් Annotated Bibliography : English language learners නමින් කෘතියක් රචනා කර ඇති අතර එහි ඉංග්‍රීසි භාෂා ඉගෙනීමේ ප්‍රධාන ගැටලු පිළිබඳ රචනා වී ඇති ලිපි පාදක කොට මෙම විස්තරාත්මක ග්‍රන්ථනාමාවලිය ඉදිරිපත් කොට ඇත. ඒ අනුව ඉගෙනුම් සාක්ෂරතා කුසලතා, ගුරුවරුන්ගේ භූමිකාව, විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා හා ඉංග්‍රීසි භාෂාව ඉගෙනීම,

විසි එක් වන සියවසේ වැඩිහිටියන්ගේ ඉංග්‍රීසි අධ්‍යාපනය, ඉගැන්වීමේ පුහුණුව හා ඉංග්‍රීසි ආධුනිකයන්ගේ කියවීමේ වර්ධනය වැනි අංශ කෙරෙහි අවධානය යොමු කරමින් ඉංග්‍රීසි භාෂාව ඉගෙනීමේ දුෂ්කරතාවයන් හා ගැටලු පිළිබඳ සාකච්ඡා කොට ඇති පර්යේෂණාත්මක ලිපි මෙම ග්‍රන්ථ නාමාවලියෙන් දක්වා ඇත.

Skjølsvold et al. (2021) විසින් Smart consumption : A Social Sciences and Humanities annotated bibliography නමින් පර්යේෂණ වාර්තාවක් සම්පාදනය කරමින් සමාජ විද්‍යාත්මක හා මානව ශාස්ත්‍ර මත පදනම් වූ ප්‍රකාශනවල එනම් සඟරා ලිපි, පොත් සහ පොත් පරිච්ඡේද ඇතුළු මූලාශ්‍රයන්හි තොරතුරු දක්වා ඇත. විශේෂයෙන්ම බලශක්තිය, තිරසාර පරිභෝජනය, ස්මාර්ට් බලශක්ති පද්ධති වැනි ක්ෂේත්‍රයන් කෙරෙහි පමණක් මෙම පර්යේෂණය සඳහා අවධානය යොමු කර ඇත. නිවාස, සේවා ස්ථාන හා ප්‍රජාවන් තුළ බලශක්ති පරිභෝජනය සම්බන්ධව සිදු කර ඇති පර්යේෂණයන්හි විශ්ලේෂණයක් මෙම ග්‍රන්ථ නාමාවලිය තුළින් ඉදිරිපත් කර ඇත.

Silva et al. (2018) විසින් රචනා කරන ලද An Annotated Bibliography on Social Issues in Post-war Sri Lanka with Particular Reference to Conflict-affected Northern and Eastern Provinces නම් කෘතිය ශ්‍රී ලංකාවේ පශ්චාත් යුධ සමයේ සිදු වූ සමාජ ගැටලු හා පීඩාවට පත් වූවන් පිළිබඳ ශාස්ත්‍රීය වාරසඟරාවල පළ වූ ලිපි පිළිබඳ විචාරාත්මක ග්‍රන්ථ නාමාවලියකි. පශ්චාත් යුධ සමයේ උතුරු නැගෙනහිර ශ්‍රී ලාංකේය ජනතාවගේ සමාජීය හා මානසික බලපෑම සම්බන්ධව, නැවත පදිංචි කිරීමේදී ඇති වූ අභියෝග, යුද්ධයෙන් පීඩාවට පත් ප්‍රජාව තුළ සමාජ සංහිඳියාව, අනන්‍යතා ගැටලු, ගැටුම් කළමනාකරණය, යුධ කම්පනය හා යහපැවත්ම ආදී ක්ෂේත්‍රයන් ඔස්සේ ප්‍රකාශයට පත් කර ඇති ලිපි මේ සඳහා පාදක කොට ගෙන ඇත.

Ferro (2017) විසින් Annotated Bibliography : Global Study on the Aggregation of Water Supply and Sanitation Services නමින් රචනා කරන ලද කෘතිය ජල සැපයුම හා සනීපාරක්ෂක සේවා සම්බන්ධයෙන් ලියවී ඇති පර්යේෂණාත්මක තොරතුරු ඇතුලත් විවරණාත්මක ග්‍රන්ථ නාමාවලියකි. පර්යේෂණයෙහි නම, කර්තෘ(න්), ප්‍රකාශිත වර්ෂය, අධ්‍යයනයේ අරමුණු, පර්යේෂණ ක්‍රමවේදය, විෂය පථය, පර්යේෂණයෙන් ලද සොයා ගැනීම්, ලිපියට ප්‍රවේශ විය හැකි ආකාරය යනාදී ලිපියේ විස්තර මෙම ග්‍රන්ථ නාමාවලියට යොදා ගෙන ඇත.

**පර්යේෂණ ගැටලුව**

විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් මෙන්ම පර්යේෂකයන් විසින් සිදු කරන පර්යේෂණ සඳහා කතරගම පාදක කොටගත් පර්යේෂණ සිදු කරනු දැකිය හැක. මානව විද්‍යාව, සමාජ විද්‍යාව, ඉතිහාසය හා පුරා විද්‍යාව, බෞද්ධ සංස්කෘතිය, භූගෝල විද්‍යාව වැනි විෂය ක්ෂේත්‍රයන්හි නියුතු ශාස්ත්‍රඥයන්ගේ අවධානය යොමු වී ඇත. ඔවුන්ට අවශ්‍ය සාහිත්‍ය ගවේෂණයකදී ඒ සම්බන්ධව ලියවුණු තොරතුරු මූලාශ්‍ර එකතුන් සොයා ගැනීම, ඒවායේ තොරතුරු එක් ස්ථානයකින් පරිශීලනය කිරීම පිළිබඳ ගැටලුවක්ව පවතී. එබැවින් පර්යේෂකයන්ගේ පහසුව සඳහා කතරගම පිළිබඳ විවිධ මානයන් ඔස්සේ ලියවුණු සාහිත්‍ය පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඇතුලත් නාමාවලියක අවශ්‍යතාවය පවතී.

**පර්යේෂණයේ වැදගත්කම**

කතරගම මෙරට සුවිශේෂී පූජනීය ස්ථානයක් වන්නේ කතරගම දේවාලය, කතරගම දෙවියන්, කතරගම පෙරහැර හා බැඳී පවතින සුවිශේෂී ලක්ෂණ නිසාය. විශේෂයෙන්ම කතරගම දේවාලයෙහි පවත්වනු ලබන ප්‍රධාන හා විශාලතම උත්සවය ලෙස සැලකෙන ඇසල පෙරහැර ශ්‍රී ලංකාවේ සුවිශේෂී සංස්කෘතිකාංග රැසක් ගෙනහැර දක්වයි. එසේම කතරගම දෙවියන් උදෙසා පවත්වනු ලබන ඉල් උත්සවය, ආලත්ති අම්මා පූජාව, නානුමුර මංගල්‍ය ආදී තවත් විශේෂාංග රැසක් ද සමඟින් ඊටම ආවේණික වූ පූජා විධි දැක ගත හැක. තවද කතරගම දෙවියන් උදෙසා සිදු කෙරෙන කාවඩි නර්තනය, ගිනි පෑගීම ආදී අංගයන්ද ඒ අතර විශේෂ වේ.

මේ ආකාරයේ විවිධ සංස්කෘතිකාංග, පූජා විධී, චාරිත්‍ර වාරිත්‍ර, වන්දනාමාන හා වත්පිළිවෙත්, ඇදහිලි හා විශ්වාස මෙරට ප්‍රදේශයෙන් ප්‍රදේශයට විවිධාකාර ලක්ෂණ සහිතව දැකිය හැක. එකී ලක්ෂණ කතරගම පුදබිම ආශ්‍රීතව ද දැකිය හැක. එබැවින් මෙම ක්ෂේත්‍රයන් පිළිබඳ අධ්‍යයන හා පර්යේෂණ කටයුතු කරනු ලබන ශාස්ත්‍රඥයන්, පර්යේෂකයන්, විද්‍යාර්ථීන් පමණක් නොව බැතිමතුන් ද ඔවුන්ගේ තොරතුරු අවශ්‍යතාවයන් සඳහා විවිධ මූලාශ්‍ර පරිශීලනය කරයි. එබැවින් තොරතුරු ගවේෂකයන්ගේ

අවශ්‍යතාවය සඳහා කතරගම පාදක කොටගත් සාහිත්‍ය මූලාශ්‍රයන්හි එකතුවක් ලෙස මෙවැනි ග්‍රන්ථ නාමාවලියක් මඟින් තොරතුරු ලබාදීම වැදගත් වේ. එසේම අවශ්‍ය පාඨකයාට, අවශ්‍ය තොරතුර, අවශ්‍ය වේලාවට, අවශ්‍ය මාර්ගයෙන් ලබා දීම පුස්තකාල සේවාවේ මුඛ්‍ය පරමාර්ථයයි. මෙම අරමුණ පෙරදැරි කොට ගනිමින් විෂය ග්‍රන්ථනාමාවලි ස්වරූපයෙන් තොරතුරු මූලාශ්‍ර සම්පාදනය කොට පාඨකයාට ඉදිරිපත් කිරීමට ද මෙම පර්යේෂණය සිදු කිරීම වැදගත් බව පෙන්වා දිය හැකිය.

සංස්කෘතික විවිධත්වය පවත්වාගෙන යාම සඳහා අස්පර්ෂණීය සංස්කෘතික උරුමය රටක වැදගත්ම සාධකයකි. සෑම ප්‍රජාවකටම වටිනා සංස්කෘතික දැනුම් සම්භාරයක් පවතින අතර විවිධ ප්‍රජාවන්වල ඇති අස්පර්ෂණීය සංස්කෘතික උරුමය පිළිබඳ අවබෝධය පැවතීම තුළින් අන්තර් සංස්කෘතික සංවාදයන්ට උපකාරී වේ. ශ්‍රී ලංකාව තුළ ප්‍රෞඪ සංස්කෘතියක උරුමයක් පවතින බැවින් ඒවා අධ්‍යයනය කරන්නන්ට තොරතුරු මූලාශ්‍ර පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමටද මෙම අධ්‍යයනය වැදගත් වේ.

**අධ්‍යයනයේ අරමුණු**

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ දකුණුලක ප්‍රදේශයේ ප්‍රධාන සිද්ධස්ථානයක් වන කතරගම පුදබිම හා ඒ ආශ්‍රිත සිරිත් විරිත්, පූජා විධි, ඇදහිලි විශ්වාස සම්බන්ධව ලියවී ඇති සාහිත්‍යයන් හඳුනා ගැනීමයි. එමෙන්ම කතරගම පුදබිම පිළිබඳ රචනා වී ඇති සාහිත්‍ය වර්ගීකරණය කිරීම හා ඒ පිළිබඳ ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඇතුලත් ග්‍රන්ථ නාමාවලිය නිර්මාණය කිරීමයි. මෙම විවරණයේ සෙසු පරමාර්ථයන් වන්නේ උපුටා දක්වන ලද මූලාශ්‍රවල ගුණාත්මක බව, අදාළත්වය සහ නිරවද්‍යතාවය පාඨකයාට දැනුම්දීමයි. එබැවින් කතරගම හා ඊට සමගාමී ක්ෂේත්‍රයන් පිළිබඳ තොරතුරු සොයන පරිශීලකයින්ට මෙම ලිපිය ඉතා වැදගත් වේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

ප්‍රධාන වශයෙන් මෙම පර්යේෂණය පදනම් වී ඇත්තේ ද්විතීක දත්ත මතය. පුස්තකාල, මුද්‍රිත ග්‍රන්ථ, වෙබ් අඩවි හා සුචි ආදිය තොරතුරු එක් රැස් කිරීමේ මූලාශ්‍ර විය.

මාර්ගගත මූලාශ්‍ර මඟින් තොරතුරු සෙවීමේදී මාර්ගගත පුස්තකාල වෙබ් අඩවි ගණනාවක් පරීක්ෂා කල අතර එමගින් අධ්‍යයනයට අදාළ තොරතුරු ලබා ගත් මාර්ගගත හා මාර්ගගත නොවන පුස්තකාල ලැයිස්තුව පහත වගුවෙහි දක්වා ඇත.

**වගුව : 1තොරතුරු ලබාගත් පුස්තකාල ලැයිස්තුව**

| පුස්තකාල වර්ගය | පුස්තකාලයේ නම |
|---|---|
| විශ්වවිද්‍යාල පුස්තකාල | රුහුණ විශ්වවිද්‍යාල පුස්තකාලය |
| | කැළණිය විශ්වවිද්‍යාල පුස්තකාලය |
| | පේරාදෙණිය විශ්වවිද්‍යාල පුස්තකාලය |
| | යාපනය විශ්වවිද්‍යාල පුස්තකාලය |
| මහජන පුස්තකාල | මාතර කුමාරතුංග මුනිදාස මහජන පුස්තකාලය |
| | කොළඹ මහජන පුස්තකාලය |
| | යාපනය මහජන පුස්තකාලය |
| ජාතික පුස්තකාල | ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය |
| | ඇමරිකාවේ කොංග්‍රස් පුස්තකාලය |
| | ඕස්ට්‍රේලියානු ජාතික පුස්තකාලය |

තොරතුරු එක්රැස් කර ගැනීමෙන් පසු ඒ හා සම්බන්ධ සාහිත්‍ය මූලාශ්‍ර රාශියක් ඇතත් මෙම ලිපිය තුළින් මුද්‍රිත ග්‍රන්ථ (පොත්පත්) වල තොරතුරු පමණක් ආවරණය කර ඇත. කතරගම ආශ්‍රයෙන් ලියවුනු වෙනත් පර්යේෂණ පත්‍රිකා, සඟරා ලිපි, වාර්තා, පුවත්පත් ලිපි, උපාධි නිබන්ධන, සංගෘහිත තැටි හෝ වෙනත් මූලාශ්‍ර මෙම අධ්‍යයනය සඳහා පාදක කොටගෙන නොමැත. ඒ අනුව මෙම පර්යේෂණයට අදාළව ග්‍රන්ථ නාමාවලිය සැකසීම සඳහා මුද්‍රිත ග්‍රන්ථවලට පමණක් සීමා වූයේ අනෙකුත් තොරතුරු මූලාශ්‍රවල විස්තර ද යොදාගත හොත් පර්යේෂණ පත්‍රිකාවක සීමාව ඉක්මවා දීර්ඝ වන බැවිනි.

එසේම මේ සඳහා තෝරාගත් ග්‍රන්ථ සිංහල, ඉංග්‍රීසි හා දෙමළ යන භාෂා ත්‍රිත්වයම නියෝජනය කරනු ලබන අතර එකම කෘතිය විවිධ වර්ෂවලදී ප්‍රකාශයට පත් කර ඇති අවස්ථාවල එක් වර්ෂයක පමණක් පළවූ කෘති තෝරා ගැනීම සිදු කරන ලදී. පර්යේෂණය තුළින් කතරගම පිළිබඳ මූලාශ්‍ර ගණනාවක් හඳුනාගත හැකි වුවද මෙම ලිපිය තුළින් මුද්‍රිත ග්‍රන්ථ 59 ක තොරතුරු ආවරණය කරමින් ග්‍රන්ථ නාමාවලිය සකසා ඇත. ග්‍රන්ථ පනස් නවයක ප්‍රමාණයක් තෝරා ගැනීමට හේතු වූයේ කතරගම සිද්ධස්ථානය හා සම්බන්ධ තොරතුරු ඇතුලත් කෘති පමණක් ග්‍රන්ථ නාමාවලියට යොදා ගැනීම නිසාය. කතරගම ආශ්‍රිතව ඇති සංචාරක ස්ථානවල තොරතුරු ඇතුලත් කෘති, කතරගම සම්බන්ධ භූගෝලීය විද්‍යාත්මක තොරතුරු ඇතුලත් කෘති, කතරගම ආශ්‍රිතව ජීවත් වූ පුද්ගලයන් පාදක කොට ගෙන නිර්මාණය වූ කෘති යනාදී පැතිකඩ ඔස්සේ ලියවුණු ග්‍රන්ථ මෙම ලිපියට යොදා ගෙන නොමැත.

ග්‍රන්ථ නාමාවලියට තෝරාගත් කෘතිවල ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු පෙළ ගැස්වීම සඳහා ඇංග්ලෝ ඇමරිකානු සුචිකරණ නීති සංග්‍රහය පාදක කොටගත් පහත තොරතුරු දක්වා ඇත.

- ග්‍රන්ථ නාමය හා කර්තෘ
- සංස්කරණය පිළිබඳ විස්තරය
- ප්‍රකාශනය පිළිබඳ විස්තරය
- භෞතික විස්තරය
- ග්‍රන්ථ මාලාව
- සටහන්
- ප්‍රමිත අංකය හා මිල

කතරගම පාදක කොටගත් මූලාශ්‍රයන්හි සවිස්තරාත්මක ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු පහත ආකෘතියට අනුව පෙළගස්වන ලදී.

ප්‍රධාන ශීර්ෂය

ග්‍රන්ථ නාමය/ කර්තෘ(න්).- සංස්කරණය.-
ප්‍රකාශක ස්ථානය : ප්‍රකාශක, ප්‍රකාශිත වර්ෂය.
භෞතික විස්තරය.- ග්‍රන්ථ මාලාව
සටහන් ක්ෂේත්‍රය
ප්‍රමිත අංකය     මිල

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

අධ්‍යයනය මඟින් ලබාගත් තොරතුරු දත්ත විශ්ලේෂණය තුළින් පරිශීලනයේ පහසුව සඳහා ග්‍රන්ථයේ අන්තර්ගත තොරතුරු පාදක කරගනිමින් පහත ආකාරයේ උප විෂයයන් යටතේ බෙදා දක්වනු ඇත.

***A - කතරගම දෙවියන්***

අමරසේන, ඇතගම ඊබට්

මහසේන හෙවත් කතරගම දෙවියෝ/ ඇතගම ඊබට් අමරසේන.-
කඩවත : සාරාංගා ප්‍රකාශකයෝ, 2013.
පි. 63 ; සෙ .මී. 21
ISBN 9789556840582

අම්බලන්ගොඩ, සේන

ශ්‍රීමත් කතරගම දෙවියෝ/ සේන අම්බලන්ගොඩ.-
පිටකොටුව : සාරංග, [දි.නැ.].
පි. 32 ; සෙ.මි. 21
ISBN 9789556780604

අරියධම්ම හිමි, ගොඩඋඩ

කතරගම දෙවියෝ/ ගොඩඋඩ අරියධම්ම හිමි.-
කොළඹ : ඇස්. ගොඩගේ, 2021.
පි. : 32චිත්‍ර ; සෙ. මී. 21
ISBN 9786240011167

අහුබුදු, අරිසෙන්

කඳදෙවි උපත/ අරිසෙන් අහුබුදු.-
]තැ.නැ. ] ; [ප්‍ර.නැ. ] , [දි.නැ.].
පි.64 ; සෙමි.21

සෙල්ල කතරගම ගණදෙවි පුවත/ සංස්. සුමන සෝමපාල.-

[තැ. නැ.] : [ප්‍ර.නො.], 1994.
පි. 72 : චිත්‍ර ; සෙ.මි. 22

කතරගම දෙවිඳුන්ට සන්දේශ කවි 1700 - 1900.-

දෙහිවල : තිසර, 1970.
විවිධ පිටු අංක සහිතයි ; සෙ.මි. 22

ද සිල්වා, එච්. ජයසේන

රුහුණු කතරගම දෙවියෝ/ එච්. ජයසේන ද සිල්වා.-
කොළඹ : ඇස්. ගොඩගේ, 2023.
පි. 196 ; සෙමී. 21.
ISBN 9786240021609

දේවප්‍රිය, කේ. ඩී

කඳසුරිඳුනි : කතරගම දේව සම්ප්‍රදාය හා ජනශ්‍රැති/ කේ. ඩී. දේවප්‍රිය.-
කොළඹ : සූරිය ප්‍රකාශකයෝ, 2017.
පි. 79 : චිත්‍ර ; සෙ.මි. 22
ISBN 9789556564419

දේවප්‍රිය, කේ.ඩී

දුටු නොදුටු කතරගම දෙවිඳු/ කේ.ඩී. දේවප්‍රිය.-
කොළඹ : සූරිය ප්‍රකාශකයෝ, 2015.
පි. 198 : ඡායාරූප ; සෙ.මි. 21
ISBN 9789556563542

බණ්ඩා, ස. ජ. සුමනසේකර

කඳකුමර සිරිත/ ස. ජ. සුමනසේකර බණ්ඩා.-
කොළඹ : රජයේ මුද්‍රණාලය, 1993.
පි. 81 ,[16] ; සෙ. මි.21

ISBN 9556100199

බණ්ඩාර, සී. එම්. තරිඳු

කතරගම දෙවියෝ/ සී. එම්. තරිඳු බණ්ඩාර.-
කොළඹ : ගොඩගේ, 2019.
පි. 264 : චිත්‍ර ; සෙ.මී. 22
ISBN 9789553096838

මාලිමගේ, අශෝක

කතරගම දෙයියෝ/ අශෝක මාලිමගේ.-
කොළඹ : රත්න, 2012.
පි. 206 ; සෙ.මී. 22
ISBN 9789556830620

රත්නසේකර, එරන්ද

වල්ලි / එරන්ද රත්නසේකර.-
උඩුබද්දාව : ෆීනික්ස් ප්‍රකාශකයෝ, 2022.
පි. 48 ; සෙ. මී. 21
ISBN 9786246321048

රත්නායක, සුදත්

මහ තෙදැති මහ බලැති කතරගම දෙවියෝ / සුදත් රත්නායක.-
කොළඹ : ඇපා පොත්හල, 2014.
පි. 32 ; සෙ.මී. 20
ISBN 9789554943087

වික්‍රමගමගේ, චන්ද්‍රා

කතරගම හා කතරගම දෙවිඳු/ චන්ද්‍රා වික්‍රමගමගේ.-
දෙහිවල : ශ්‍රීදේවි, 1997.
පි. [4] 16 : වර්ණ චිත්‍ර ; සෙ.මී. 19

සේනසිංහ, තිලක්

කතරගම දෙවි මහිමේ/ තිලක් සේනසිංහ.-
ගණේමුල්ල : සුරේන්ද්‍ර ප්‍රකාශක, 1988.
පි. 71 ; සෙ.මී. 21

සූරියබණ්ඩාර, මිස්සක

කතරගම දෙවිඳු/ මිස්සක සූරියබණ්ඩාර.-
දන්කොටුව : වාසනා, 2011.
පි. 96 : චිත්‍ර ; සෙ.මී. 22
ISBN 9789556559941

සෝමපාල, සුමන

සෙල්ල කතරගම ගණදෙවි පුවත/ සුමන සෝමපාල.-
පිළියන්දල : සනත්ප්‍රිය පුත්‍රයෝ, 1994.

පි. 72 ‍: චිත්‍ර ; සෙ.මී. 21

සෝමපාල, කතරගම සුමන

කතරගම දෙවිරද/ කතරගම සුමන සෝමපාල.-
බොරලැස්ගමුව : ප්‍රබුද්ධ, 1986.
පි. 71 : චිත්‍ර ; සෙ.මී. 21

## *B - කතරගම පුදබිම*

කතරගම/සම්. පරවාහැර පේමානන්ද හිමි ; සංස්. ගලගම ධම්මික හිමි.-
බෝදගම : ආර්. ඩබ්. ආර්. විජයනායක, 1949.
පි. 132

කතරගම කිරිවෙහෙර ධර්ම දේශනා.-
කළුතර : [ප්‍ර. නැ] 2002.
පි. 93 ; සෙ.මී. 21

සෝමපාල, කතරගම සුමන
කතරගම පුද බිම/ කතරගම සුමන සෝමපාල.-
කොළඹ : [ප්‍ර. නැ.], 1992.
පි. vi, 74 : චිත්‍ර ; සෙ.මී. 22

ප්‍රේමානන්ද හිමි, පරවාහැර
කතරගම/ පරවාහැර ප්‍රේමානන්ද හිමි.-
බෝදගම : ආර්. ඩබ්. ආර්. විජයනායක, 1949.
පි. 132 ; සෙ.මී. 22

සමරසිංහ, ජයන්ත
කතරගමට පාද යාත්‍රාව= Kataragama foot pilgrimage/ජයන්ත සමරසිංහ.-
කෝට්ටේ : කර්තෘ, 2003.
පි. 92 : සෙ.මී. 22
සිංහල, ඉංග්‍රීසි, දෙමළ භාෂා මාධ්‍ය වලින් තොරතුරු අන්තර්ගතය.
ISBN 9559824903

ගුණසෝම, ගුණසේකර
යාපනය සිට කතරගමට/ ගුණසේකර ගුණසෝම.-
කොළඹ : ගොඩගේ, 2007.
පි. 104 ; සෙ.මී. 22
ISBN 9789553004130

## *C - කතරගම දේවාලය*

කුලසිංහ, ඒ. එම්.
උග්ගල් අලුත්නුවර ඓතිහාසික කතරගම් දේවාල වත/ ඒ. එම්. කුලසිංහ.-
[තැ. නැ.] : [ප්‍ර.නැ.], 2009.
පි. xix, 122 : වර්ණ චිත්‍ර ; සෙ.මී. 22
ISBN 9789559981015

ජයවර්ධන, සෝමපාල
රුහුණු විත්ති / සෝමපාල ජයවර්ධන.-
දෙහිවල : තිසර ප්‍රකාශකයෝ, 1977.

පි. 58 ; සෙමී. 18

ගමගේ, ඉන්දු

බළන්ගොඩ උග්ගල් අලුත්නුවර කතරගම් දේවාලය/ඉන්දු ගමගේ.-
කොළඹ : ගොඩගේ, 2016.
පි. 256 : චිත්‍ර ; සෙ.මී. 22
ISBN 9789553067203

## *D - කතරගම පෙරහැර*

ප්‍රනාන්දු, ඩබ්. ලයනල්
කතරගම සහ එහි උත්සව : 1819 - 1939/ ඩබ්. ලයනල් ප්‍රනාන්දු ;
පරි. අසෝක මාලිමගේ.- කොළඹ : සූරිය ප්‍රකාශකයෝ, 2005.
පි. 265 ; සෙ.මී. 22
පුරාණ ලක්දිව කතරගම පෙරහැර ඉතිහාසය පිළිබඳ තොරතුරු ඇතුලත්ය.
ISBN 9558892858

වක්වැල්ල, ෆෙඩ්රික්
කතරගම පෙරහැර වර්ණනා/ ෆෙඩ්රික් වක්වැල්ල.-
කොළඹ : ස්වස්තික, 1954.
පි. iv, 45 ; සෙ.මී. 18

## *E - කතරගම ඉතිහාසය*

රණසිංහ, සුමිත්
කතරගම් පුවත/ සුමිත් රණසිංහ.-
කොළඹ : මධ්‍යම සංස්කෘතික අරමුදල, 2011.
පි. xvi, 214 : ඡායාරූප : සිතියම් ; සෙ.මී. 26
ISBN 9789556132328

වාචිස්සර හිමි, වැවහමන්දූවේ
කතරගම ඉතිහාසය/ වැවහමන්දූවේ වාචිස්සර හිමි.-
තංගල්ල : මණ්ඩාදූවේ ධීරානන්ද හිමි, 2017.
පි. 132 : චිත්‍ර ; සෙ.මී. 21

සෝරත හිමි, අලුත්වැව
කතරගම ලිපි/ අලුත්වැව සෝරත හිමි.-
නුගේගොඩ : සරසවි ප්‍රකාශකයෝ, 2013.
පි. 276 : චිත්‍ර ; සෙ.මී. 22
ISBN 9789556717204

## *F - චාරිත්‍ර වාරිත්‍ර, සිරිත් විරිත් හා ඇදහිලි විශ්වාස*

කතරගම දේව සංකල්පය සහ ඒ හා බැඳුණු අභිචාර විධි පිළිබඳ සමාජ මානව හා
පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්.- මාතර : රුහුණ විශ්වවිද්‍යාලය, 2014.
පි. xiii, 82 ; සෙ.මී. 22

වාච්චගේ, සුමනසිරි
කතරගම දේවාලයේ ඉතිහාසය සහ අභිචාර විධි/ සුමනසිරි වාච්චගේ.-
මාතර : කර්තෘ, 2003.
පි. vi, 110 ; සෙ.මී. 21

වීරසේකර, ඩබ්. එම්. සුනිල් ශාන්ත
මධ්‍යම වලවේ ගංගා නිම්නයේ කතරගම දේව භක්තිය හා අභිචාර විධි
පිළිබඳ ඓතිහාසික හා සමාජ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්/ ඩබ්. එම්.
සුනිල් ශාන්ත වීරසේකර.- මාතර : කර්තෘ, 2020.
පි. [3], xi, 446 ; සෙ.මී. 22

සෝරත හිමි, අළුත්වැව
කතරගම පුද සිරිත්/ අළුත්වැව සෝරත හිමි.-
නුගේගොඩ : සරසවි, 2000.
පි. 180 : වර්ණ චිත්‍ර ; සෙ.මී. 22
ISBN 9555731217

සෝරත හිමි, අළුත්වැව
රුහුණු කතරගම දේවාලය ආශ්‍රිතව කතරගම උදෙසා පවත්වන
බෞද්ධ සහ හින්දු පුද සිරිත් පිළිබද විමර්ශනයක්/ අළුත්වැව සෝරත හිමි.-
[තැ. නැ.] : [ප්‍ර.නැ.], 1980.
පි. x, 190 ; සෙ.මී. 30

***A – KATARAGAMA SHRINE***

Rasiah, Arumugam
Kataragama=கதிர்காமம்/ Arumugam Rasiah.-
Sithankerny : holiday ashram, 1981.
x, 118 p. ; 23cm
Divine Power of Kathirkama and Methods of Realisation
ISBN: 78752

Asangananda, Swami
Kataragama : the holy of holies of Sri Lanka/ Swami Asangananda,-
Gorakhpur : The kalyana kalpataru, 1935.
15 p.
ISBN: 25323

Dharmaratne, Mohan
Katharagama : city of the divine spirit / Mohan Dharmaratne.-
Nugegoda : Sarasavi Publishers, 2016.
175 p. ; 19 cm
ISBN 9789553101259

Gunasekara, Sunil
Walking to Kataragama/ Sunil Gunasekara.-
Colombo : International Centre for Ethnic Studies, 2007.
v, 675p. : 23cm
ISBN: 9789555801102.

Harrigan, Patrick
Kataragama : the mystery shrine / Patrick Harrigan ;
Ed. G. John Samuel.- Chennai : Institute of Asian Studies,1998.
v, 145 p. : ill. ; 23 cm

Hassan, M.C.A.
The story of the Kataragama mosque and shrine / M.C.A. Hassan.-
Colombo : Ceylon, 1968.
36 p. : plates ; 21cm

Jayasinghe, J. D. D. Prathibhani
Pilgrimage tourism in Kataragama : the study of pilgrimage for foster peacebuilding in Sri Lanka/ J.D.D.Prathibhani Jayasinghe.-
Matara : Author, 2009.
viii,61p. ; 24cm

Jayawardna, A.M.
Kataragama/ A.M. Jayawardna.-
Colombo : Frewin & Co Ltd, [n.d.].
x,118p.: Plates ; 20cm

Kalyanasunderam, Selvam
A history of Kataragama and Theivanaiamman Thevasthanam / Selvam Kalyanasunderam.- Colombo : Vishva Hindu Parishad, 1980.
44, [12] p. : plates : ill. ; 20cm

Perera, Sam
The legend of Kataragama in Sri Lanka/ Sam Perera ;
Illustrated by Alex, Stewart.- Colombo : Popsicle Books, 2016.
32p. ; 22cm
ISBN:9789550041107

Rasanayagam, C.
Kataragama : a historical sketch / C. Rasanayagam.-
Colombo : kumaran press, 1938.
28p.
ISBN 43182

Wirz, Von Paul
Kataragama : the holiest place in Ceylon/ Von Paul Wirs ; translated by Doris Berta Pralle.- Colombo : Lake house, 1966.
57, [16]p. ; plate : ill. : portraits ; 21cm
ISBN: 9558156663

Krishnapillai, Vimala
Kathirkamam/ Vimala Krishnapillai.- 1st ed.-
[Colombo] : Thiruvadi trust of sivayogarswami, 2017.
xxxii, 222p. : maps, col. Photos ; 22cm
ISBN: 9789557408002

Jakannātan, K. V.
Katirkāma yāttirai/ K. V. Jakannātan.- 1st ed.
Chennai : Amuta Nilaiyam, 1953.
iv, 76 p. : ill. ; 19 cm.

***B – KATARAGAMA FESTIVAL***

Fernando, W. Lionel
Kataragama and its festivals: 1819 – 1939/ W. Lionel Fernando.-
Panadura : Author, 1985.
xxii, 208p. ; 21cm

Kataragama : the esala festivals from the government agents' diaries 1852-1939/
Ed. by S. D. Saparamadu.- Dehiwala : Tisara Pub., 2004.
277p. ; 22cm
ISBN: 9789555640824

***C – RITUAL AND BELIEF***

Obeyesekere, Gananath
Medusa's hair : an essay on personal symbols and religious experience /
Gananath Obeyesekere.- Chicago : University of Chicago Press,1981.
xiii, 217p. : ill. ; 23 cm
ISBN: 0226616002

Wawwage, Sumanasiri
History and rituals of the Kataragama shrine/ Sumanasiri Wawwage.-
Matara : Author, 2007.
vi, 73p. ; 24cm

***D – KATARAGAMA GOD***

Wickramagamage, Chandra
Kataragama ha kataragama devindu/ Chandra Wickramagamage.-
[s.l] : Author, 1997.
16p. ; 19cm

Cōmakāntan
Poykai malar / Cōmakāntan.
[Chennai] : [s.n.], 1995.
176 p. ; 19 cm
Articles and speeches on the temples dedicated to Murugan,
Hindu deity, at Kataragama, Sri Lanka.

Kaṇapatippiḷḷai, Tenpulōliyūr M.
Murukan Katirkāmam/ Tenpulōliyūr M. Kaṇapatippiḷḷai.-
[s.l.] : [s.n.], [1967].
100p. ; 19cm

**නිගමන**

කතරගම පිළිබඳ රචනා වී ඇති කෘති අතර වැඩි ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා වී ඇත්තේ කතරගම පුදබිම, කතරගම දෙවියන්, චාරිත්‍ර වාරිත්‍ර, සිරිත් විරිත් හා ඇදහිලි විශ්වාස සම්බන්ධයෙනි. කතරගම පිළිබඳ ශ්‍රී ලංකාව තුලදී ප්‍රකාශයට පත් වූ කෘති මෙන්ම, වෙනත් රටවලදී ප්‍රකාශයට පත් වූ කෘති ද අන්තර්ගත වී තිබේ. කතරගම පිළිබඳ ග්‍රන්ථ රචනා කරන ලද කතුවරුන් අතර ශ්‍රී ලංකාවේ කතුවරුන් මෙන්ම විදේශීය රටවල ජීවත්වන ශ්‍රී ලාංකික කතුවරුන් සිටීම විශේෂත්වයකි. එපමණක් නොව විදේශීය කතුවරුන් ද කතරගම සම්බන්ධව ග්‍රන්ථ රචනා කර ඇති බව මෙම අධ්‍යයනයෙන් සොයා ගත හැකි විය. මෙම කෘතීන් වැඩි ප්‍රමාණයක් ලියවී ඇත්තේ සිංහල හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙනි. දෙමළ භාෂා මාධ්‍යයෙන් ලියවුණු කෘතිද සුළු ප්‍රමාණයක් ඇත. මෙහි විශේෂත්වය වන්නේ මෙරට පුස්තකාලවල පමණක් නොව විදේශීය රටවල පුස්තකාලවලද කතරගම පිළිබඳ රචනා වූ කෘති දැකිය හැකිවීමයි. ඇමරිකාවේ කොංග්‍රස් පුස්තකාලය, ඕස්ට්‍රේලියාවේ ජාතික පුස්තකාලය ඒ අතර සුවිශේෂී වේ.

**යෝජනා**

- විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් විසින් මෙම ක්ෂේත්‍රය පාදක කොට ගනිමින් විවිධ පර්යේෂණ සිදු කරන බැවින් ඔවුන්ගේ පහසුව සඳහා විශ්වවිද්‍යාල පුස්තකාලවල (දකුණු ප්‍රදේශයට විශේෂිතව) විශේෂිත එකතුවක් පවත්වාගෙන යාම සුදුසු වේ.
- මෙම විෂය කේෂ්ත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන පර්යේෂකයන් හා වෙනත් පාර්ශවයන්ගේ අවශ්‍යතාවයන් සඳහා ඊට සමගාමී කෘති ඇතුලත් ප්‍රාදේශීය එකතුවක් කතරගමට සමීපව පිහිටි මහජන පුස්තකාල තුළ සංවිධානය කිරීම සුදුසු වේ.
- පූජනීය ස්ථාන ආශ්‍රිත පුස්තකාල හෝ මෙම පර්යේෂණයට සමගාමී විෂය ක්ෂේත්‍රය පිළිබද ඇති ආයතනික පුස්තකාලවල මීට සමගාමී එකතුවක් පවත්වාගෙන යාම සුදුසු වේ.
- මෙම මූලාශ්‍ර අතර සමහර පිටපත් වසර ගණනාවක් ඉපැරණි මූලාශ්‍ර වන අතර ඇතැම් පිටපත් සීමා සහිත බැවින් මතු පරපුර සඳහා ඒවා ආරක්ෂා කර තැබීම සුදුසු බව යෝජනා කල හැකිය.
- ඒ ඒ ප්‍රදේශයන්ට ආවේණික පූජා විධි, චාරිත්‍ර වාරිත්‍ර, ඇදහිලි හා විශ්වාස වැනි දේශීය දැනුම ඇතුලත් තොරතුරු මේවායෙහි අන්තර්ගතව ඇති බැවින් අස්පර්ෂණීය සංස්කෘතික උරුමයන් සංරක්ෂණය පිළිබඳව සැලකිලිමත් වීම සුදුසු වේ.

**අශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


ආනන්ද තිස්ස, ආර්.ඩී. (2019). ශ්‍රී ලංකා පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යාපනයෙහි ලා පාදක සාහිත්‍ය පිළිබඳ විචාරාත්මක විවරණයක්. තුළ පන්නිල, ලාල් , ප්‍රනාන්දු, අයි.ඩී.කේ.එල්. සහ රාමනායක, කෝකිල (සංස්.), *පුස්තකාල විද්‍යාව හා තොරතුරු සාක්ෂරතාව : ආනන්ද කරුණාරත්න උපහාර ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය.* .(74-51 .පි) රුහුණ විශ්වවිද්‍යාලය.

ඥාණවිමල හිමි, කිරිඇල්ලේ. (සංස්.) (1961). *රසවාහිනිය*, ගුණසේන සමාගම.

පියරතන හිමි, මකුළුදූවේ. (සංස්.) (1941). *ධාතු වංශය*, ගුණසේන සමාගම.

බුද්ධත්ත හිමි, පොල්වත්තේ. (සංස්.) (1956). *මහාවංශය*, ගුණසේන සමාගම.

රණසිංහ, පියදාස (2002). *සංක්ෂිප්ත ඇංග්ලෝ ඇමරිකානු සුචිකරණ නීති සංග්‍රහය*, කතෘ ප්‍රකාශනයකි.

වාච්චගේ, සුමනසිරි. (2003). *කතරගම දේවාලයේ ඉතිහාසය හා අභිචාර විධි*, කතෘ ප්‍රකාශක.

විමලකිත්ති හිමි, මැද උයන්ගොඩ (1954). *ශිලා ලේඛන සංග්‍රහය*, දොඩන්ගොඩ හා සමාගම.

සද්ධාතිස්ස හිමි, බේම්තොට. (සංස්.) (1953). *පූජාවලිය,* කරුණාධාර මුද්‍රණාලය.

සෝරත හිමි, අලුත්වැව. (2000). *කතරගම පුද සිරිත්*, සරසවි ප්‍රකාශකයෝ.

Al-Ansari, Husain H. (2008). Library and Information Science Literature on the Gulf Cooperation Council (GCC) Countries: A Bibliographic Analysis, In *Technical Services Quarterly*, 25:3, 21-34, DOI: 10.1080/07317130802128593.

De Silva, A.P.U. (2016). Asian Elephants in Sri Lanka: A Selective Annotated Bibliography. In Manatunga, Anura (Ed.), *International Conference on Asian Elephants in Culture & Nature.* (pp. 316-326). University of Kelaniya.

Ferro, Gustavo ( .(2017*Annotated Bibliography: Global Study on the Aggregation of WaterSupply and Sanitation Services*, International Bank for Reconstruction and Development. The World Bank.

Hector-Mason, Anestine & Bardack, Sarah. ( .(2010*Annotated Bibliography: English language learners*, American Institutes for Research.

Issak, Aissa (comp.). ( .(2000*Public libraries in Africa: a report and annotated bibliography*. International Network for the Availability of Scientific Publications (INASP).

Jayawarghane, Chulantha & Senevirathna, Thushari. (2023). *Bolgoda Ecosystem: a selected bibliography*, nine publishing.

National Library of Sri Lanka. (1994). *Selected Bibliography of Kataragama*. National Library of Sri Lanka.

Silva, K.T., Herath, D., Usoof-Thowfeek, R., Thomas, N.J., & Taylor, M. (2018). *An Annotated Bibliography on Social Issues in Post-war Sri Lanka with Particular Reference to Conflict-affected Northern and Eastern Provinces*, the International Centre for Ethnic Studies, and the World Bank.

Skjølsvold, T. M., Pechancová, V., Judson, E., Robison, R. & Suboticki, I., ( .(2021*Smart Consumption: A Social Sciences and Humanities annotated bibliography,* Cambridge: Energy-SHIFTS.

The Netherlands Institute of International Relations. (2004). *Dealing with Diversity: Annotated Bibliography.* NIIR.